ශ්‍රී ලංකා සංස්කෘතික අධ්‍යාපන කේන්ද්‍රය, ඩුබායි — යොමු අංකය 1718-004

2017 නොවැම්බර් 03

දයාබර දෙමාපියන් වෙත,

<u>වාර්ෂික මහා සභා රැස්වීම</u>

නව අධ්‍යයන වසරේ දහම් පාසල් වාර්ෂික මහා සභා රැස්වීම **2017 නොවැම්බර් 11 වැනිදා, සෙනසුරාදා** පෙ. ව. 9:00 සිට ප.ව. 12:30 දක්වා දහම් පාසල් ශාලාවේදී පැවැත්වීමට කටයුතු යොදා ඇත.

අපගේ දූදරුවන් යහපත් ගුණගරුක පුරවැසියන් ලෙසට මවුබිමට දායද කිරීම සඳහා අපමණ වෙහෙසක් දරා පවත්වාගෙන යන මෙම ජාතික මෙහෙවරින් ඇයේ දරුවන්ට උපරිම ප්‍රයෝජන ලබා දීමට දෙමාපියන් ලෙසට ඔබගෙන් ලැබෙන දායකත්වය අප ඉතා අගය කර සිටිමු. අප දූදරුවන්ට හොඳ දහම්පාසල් අධ්‍යාපනයක් ලබාදීම සඳහා දෙමව්පියන් වන ඔබගේ සහයෝගය කුමන ආකාරයකින් වියයුතුද, ඒ සඳහා දහම් පාසල් වැඩකටයුතු සාර්ථක කරගන්නේ කෙසේද යන කරුණු සාකච්ඡා කර විධිමත් ලෙසට සැලසුම් සම්පාදනය කිරීම මෙම රැස්වීමේ මූලික අභිප්‍රායයි. එබැවින් මෙම රැස්වීමට සහභාගී වීම ඔබගේ වගකීමක් බව කරුණාවෙන් සලකන්න.

මෙම රැස්වීම සඳහා උදේ වරුවේ, දහවල් වරුවේ සහ සවස් වරුවේ පන්ති වලට සහභාගී වන සියලුම දරුවන්ගේ දෙමාපියන් වෙත ආරාධනය කර සිටින අතර ඔබ සැමගේ සහභාගීත්වය අත්‍යවශ්‍ය බව නැවතත් අවධාරණය කර සිටිමු.

කරුණාකර දරුවාගේ ශිෂ්‍ය වාර්තා පොත රැගෙනවිත් එහි ඔබගේ පැමිණීම සනිටුහන් කිරීමට දහම් පාසලේ සංවිධායක මණ්ඩලයේ සටහන ඇතුලත් කරගන්නා මෙන් කාරුණිකව ඉල්ලා සිටිමු.

<u>මෙම මහා සභා රැස්වීම පැවැත්වෙන දිනයේදී ද වාහන නැවතීමේ නීතිය ක්‍රියාත්මක වන බැවින් ඒ ගැන සැලකිලිමත් වන මෙන් කරුණාවෙන් ඉල්ලා සිටිමු.</u>

තෙරුවන් සරණයි!

සංවිධායක මණ්ඩලය, ඩුබායි දහම් පාසල

Sri Lanka Consulate General Office, No. 2, Street 322-B, Al Hudaiba, Dubai, UAE. Postal: PO Box 51528, Dubai, UAE.
TP. +971 4 3986535, Fax: +971 4 3984687, E Mail: dahampasaladubai@gmail.com, Web: http://www.dhahampasala.org